For more past papers and exam resources,visit www.pastpaperszone.lk

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

තෙවන වාර පරීක්ෂණය - 2022(2023)
Third Term Test – 2022(2023)

1621

6 ශ්‍රේණිය
Grade 6

ඉතිහාසය I - II

කාලය පැය 2 යි

i කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුලින් තෝරා හිස්තැන මත ලියන්න.

01) ක්‍රිස්තු වර්ෂ 4 වන සියවසේදී රචනා කරන ලද සාහිත්‍ය මූලාශ්‍රයක් වන්නේ ..........................යි.

(මහාවංශය/ දීපවංශය /ථූපවංශය )

02) ශ්‍රී ලංකාවේ අක්ෂර භාවිතය පිළිබඳ අවුරුදු ..................................................පමණ ඉතිහාසයක් තිබේ.

( දෙදහස් දෙසිය පනහක/ දෙදහස් තුන්සීය පනහක /තුනදහස් දෙසිය පනහක)

03) "හැකි මිනිසා" යන නමින් හැඳින්වූ මානවයා..........................................ය.

( හෝමෝසාපියන් /හෝමෝ ඉරෙක්ටස් /හෝමෝ හැබිලස් )

04) ඊජිප්තු වැසියන් විසින් භාවිත කරන ලද අක්ෂර හැඳින්වෙන්නේ ඊජිප්තු............................................... නමිනි

(චිත්‍රාක්ෂර /කූන්‍ය අක්ෂර /රූපාක්ෂර)

05) නගරයක් අසල පළමුවරට වැවක් ඉදි කරන ලද්දේ ............................................................ රජතුමා විසිනි.

(වසභ/ පණ්ඩුකාභය / දේවානම්පියතිස්ස)

- අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (√ ) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුල ලියන්න.

06) බුද්ධ වර්ෂ ආරම්භ වන්නේ බුදුන් වහන්සේගේ පරිනිර්වාණය වූ දින සිටය. ( )

07) මහා හිම යුගය ආරම්භ වන කාලයේ කැනඩාවේ චිම්පන්සීන් වර්ගයක් අනෙක් අයට වඩා වෙනස් ආකාරයකට හැඩ ගැසුණි. ( )

08) මිනිසුන් ආගමික කටයුතුවලට නැඹුරුවීම පළමුවරට පිළිබිඹු වන්නේ මධ්‍ය ශිලා යුගයේ දී ය ( )

09) ගොවිතැන් කිරීමට පුරුදු වූ මෙරට පැරණිතම ජනතාව ජීවත් වූයේ කඳුකර ප්‍රදේශවල ය. ( )

10) අනුලා දේවිය පැවිදි වීමෙන් පසු මෙරට මෙහෙණි සසුන ආරම්භ විය ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන වචනය ලියන්න.**

11) පළමුවරට ගොඩබිම පහළ වූ පාද කිහිපයක් සහිත හැකරැල්ලන් වැනි සතුන් ව්‍යාප්ත වූ යුගය හැඳින්වෙන්නේ ............................................................... යුගය නමිනි.

12) වෘත්තයකට අංශක 360 ක් ඇති බව සොයාගත් ගණිතඥයන් සිටියේ............................ ශිෂ්ටාචාරයේ ය.

13) විජය කුමරු ඇතුළු පිරිස් මෙරටට ගොඩබට ස්ථානය ............................................නමින් හැඳින්වේ.

14) මිහිඳු හිමියන් ඇතුළු පිරිසට වාසය කිරීම සඳහා පූජා කළ ගල් ගුහා ..............................නමින් හැඳින්වේ.

15) ...................................................රජතුමා මින්නේරි දෙවියන් යන අන්වර්ථ නාමයෙන් හඳුන්වයි .

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි ම පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16) මිනිසෙකු වීමට නැඹුරුවක් ඇති කළ පැරණි ම වානරයා හැඳින්වෙන්නේ කිනම් නමකින් ද?

1. හෝමෝ හැබිලස් 2. හෝමෝ ඉරෙක්ටස් 3. හෝමෝසාපියන් 4. ඔස්ට්‍රලෝපිතිකස්

17) දුප්පත් පොහොසත් යන බෙදීමක් මුල්වරට ඇතිවූයේ,

1. මධ්‍ය ශිලා යුගයේ දී ය. 2. පුරාශිලා යුගයේ දී ය.
3. නව ශිලා යුගයේ දී ය. 4. නව මධ්‍ය ශිලා යුගයේ දී ය.

18) මොහෙන්ජොදාරෝ, හරප්පා යන නගර අයත් ශිෂ්ටාචාරය කුමක් ද?

1. ඉන්දු නිම්න 2. මායා 3. චීන 4. ඊජිප්තු

19) ත්‍රිපිටකය පොත්පත්වල ලිවීම ආරම්භ වූයේ කිනම් රජුගේ රාජ්‍ය කාලයේදී ද?

1. වසභ 2. වළගම්බා 3. දුටුගැමුණු 4. මහසෙන්

20) ධාතුසේන රජු විසින් කරවන ලද වාරි තාක්ෂණයක් වන්නේ ,


1. කලා වැව යි 2. තිසා වැව යි 3. අභය වැව යි 4. මින්නේරි වැව යි

(ල. 2×20=40)

## ii කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **ඔබ විසින් පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

A රූපය



01) (අ) i) යාබද A රූපයේ දැක්වෙන්නේ කුමක් ද?


ii) එය සකස් කර ඇත්තේ කුමකින් ද?

iii) මෙය සාදන ලද්දේ කවුරුන් විසින් ද?

iv) මෙම නිර්මාණය සිදු කරන ලද කාලවකවානුව ලියන්න.

(ල. 04)

B රූපය



(ආ) i) B රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

ii) එය ඉදිකරන ලද්දේ කවුරුන් විසින් ද?

iii) මෙහි තැන්පත් කර ඇති ධාතූන් වහන්සේ නම් කරන්න

iv) මෙම දාගැබ වටා වටදාගෙයක් ඉදිකරන ලද්දේ කවුරුන් විසින් ද?

(ල. 04)

(ඇ) i) ඉතිහාසය හැදෑරීමට උපයෝගී වන සෑම දෙයක්ම හැඳින්වීම සඳහා භාවිත වන පොදු නම කුමක් ද ?

ii) මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ ජීවත් වූ වෙළඳාමේ නිරත වූ පිරිස හැඳින්වූයේ කුමන නමකින් ද?

iii) මහසෙන් රජු විසින් ඉදිකරවන ලද හුරුළු වැව අතීතයේ හැඳින්වූයේ කුමන නමකින් ද?

iv) වළඹ්බා රජු විසින් අභයගිරි විහාරය ඉදි කොට පූජා කරන ලද්දේ කවුරුන් හට ද? (ල. 04)

02. i) පහත සඳහන් වර්ෂ සකස් වී ඇත්තේ කිනම් සිදුවීම් පදනම් කරගෙන දැයි සඳහන් කරන්න.

A ක්‍රිස්තු පූර්ව -

B ශක වර්ෂ -

C හිජ්රි වර්ෂ -

(ල. 03)

ii) ඉතිහාසය හැදෑරීමට යොදා ගන්නා ප්‍රධාන මූලාශ්‍ර වර්ග දෙක සඳහන් කර ඒ සඳහා උදාහරණය බැගින් ලියන්න. (ල. 04)

iii) A මහාවංශය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද? (ල. 01)

B ඉතිහාසය ඉගෙන ගැනීමේ ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ල. 04)

03) i) A මිනිසා බිහිවීම ආරම්භ වන්නේ කිනම් පරම්පරාවකින් ද? (ල. 01)

B ඔබ සඳහන් කරන ලද එම පරම්පරාවෙන් මානව පරම්පරාවක් බිහිවීමට බලපෑ ප්‍රධාන හේතුව කුමක් ද? (ල. 02)

ii) මිනිසාගේ සංස්කෘතික දියුණුව බෙදෙන ප්‍රධාන අවධි දෙකක් නම් කර එම එක් එක් අවධියේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ එක බැගින් ලියන්න. (ල. 04)

iii) A මහා හිම යුගය අවසානයේ ඇති වූ අලුත් දේශගුණික තත්ත්වය හැඳින්වෙන්නේ කිනම් නමකින් ද? (ල. 02)

B පහත සඳහන් කරන ලද ධාන්‍ය වර්ග මුල්වරට වගා කළ ස්ථානය ලියා දක්වන්න.

a) තිරිඟු b) වී c) බඩඉරිඟු (ල. 03)

04) i) පහත නම් කරන ලද ශිෂ්ටාචාර වර්තමානයේ හඳුන්වනු ලබන නම් ලියා දක්වන්න.

A මෙසපොතේමියානු ශිෂ්ටාචාරය

B ඊජිප්තු ශිෂ්ටාචාරය

C ඉන්දු නිම්න ශිෂ්ටාචාරය (ල. 03)

ii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් වැසියන් ඉතා දියුණු ජලනළ පද්ධතියක් භාවිත කර ඇති බව සනාථ කරන කරුණු දෙකක් ලියා දක්වන්න. (ල. 04)

iii) පහත දක්වා ඇති තොරතුරු වලට අදාල පිළිතුර වරහන් තුලින් තෝරා ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A ඊජිප්තුව පාලනය කරන ලද රජ පෙළපත

B ඊජිප්තු වැසියන් ලෝකයට දායාද කළ විශිෂ්ටතම නිර්මාණය

C මෙසපොතේමියානු සමාජයේ සිටි බලවත් ම පිරි

D පොළොවට අධිපති දෙවියන් හඳුන්වන ලද නම

E කඩදාසි හා මුද්‍රණ යන්ත්‍රය මුලින්ම ලෝකයට හඳුන්වා දෙන ලද ශිෂ්ටාචාරය

( එන්කිකී / පාරාවෝ /එන්ලිලී / පිරමීඩ /පූජකවරුන්/ චීන ශිෂ්ටාචාරය /මායා ශිෂ්ටාචාරය)
(ල. 05)

05) i) A දූපතක් වූ ශ්‍රී ලංකාව මුලින්ම ජනාවාස වූයේ කුමන කාල වකවානුවකදී ද?

B මෙරට ජනාවාස කළ මිනිසුන් විසූ මුල් යුගය හැඳින්වූයේ කිනම් නමකින් ද?

C එම මිනිසුන් භාවිත කළ ගලින් සැදූ මෙවලම් හැඳින්වූයේ කිනම් නමකින් ද? (ල. 03)

ii) A විජය කුමරු ඇතුළු පිරිස් මෙරටට පැමිණෙන විට මෙරට ජීවත් වූ ගෝත්‍රික ජන කණ්ඩායම නම් කරන්න. (ල. 01)

B පහත නම් සඳහන් ඇමතිවරුන් විසින් පිහිටුවා ගන්නා ලද ජනාවාස හැඳින්වූ නම් සඳහන් කරන්න

a) උපතිස්ස ඇමති B ) අනුරාධ ඇමති C) දීඝායු ඇමති (ල. 03)

iii) A ගොවිතැන් කටයුතු වලට හුරු වූ කඳුකර ජනතාව ජීවත් වූ බිම් හැඳින්වූයේ කුමන නමකින් ද? (ල. 02)

B කඳුකර ප්‍රදේශවල ජීවත් වූ මෙම ජනතාවගේ ජීවන රටාවේ විශේෂ ලක්ෂණ 3 ක් ලියන්න. (ල 03)

L.C

1618

06) i) පණ්ඩුකාභය රජුගේ,

A මව　　B පියා　　C ගුරුවරයා　　නම් කරන්න (ල. 03)

ii) පණ්ඩුකාභය රජු විසින් අනුරාධපුර නගරය නිර්මාණය කිරීමේදී එයට එකතු කරන ලද අංග ලක්ෂණ හතරක් ලියන්න. (ල. 04)

iii) A දේවානම්පියතිස්ස රජු විසින් අනුරාධපුර නගරයේ නගර සීමා ලකුණු කිරීම සඳහා යොදාගත් ඇතුන් දෙදෙනාගේ නම් ලියන්න. (ල. 02)

B පහත සඳහන් සිදුවීම් සිදු වූ ස්ථානය ලියා දක්වන්න

a) සංඝමිත්තා තෙරණිය සමඟ ශ්‍රී මහා බෝධීන් වහන්සේ රැගත් නෞකාව පැමිණි වරාය

b) දුටුගැමුණු රජු එළාර රජු සමඟ සටන් කළ ස්ථානය

c) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලද ස්ථානය (ල. 03)

07) i) පහත සඳහන් කාර්යයන් සිදුකර කළ ලද්දේ කවුරුන් විසින්දැයි වරහන් තුළ ඇති පිළිතුරු අතරින් තෝරා ලියන්න

A දුටුගැමුණු රජු විසින් කෘෂිකර්මාන්තය නගාසිටුවීමට දීඝාමඩුල්ලට යැවූ පුද්ගලයා

B වසභ රජු විසින් යාපනය ප්‍රදේශය පාලනය කිරීම සඳහා පත් කළ ඇමතිවරයා

C ධාතුසේන රජු කලා වැවේ සිට තිසා වැවට ජලය ගෙන යාමට ඉදිකළ ඇළ මාර්ගය

(ඇළහැර ඇළ, දුටුගැමුණු රජු, ඉසිගිරිය, යෝධ ඇළ, නන්දිමිත්‍ර, සද්ධාතිස්ස කුමරු ) (ල. 03)

ii) A වළගම්බා රජුගේ අගබිසව නම් කරන්න (ල. 01)

B එතුමාගේ පාලන කාලයේ දී බුදු දහමෙහි දියුණුව සඳහා සිදුකරන ලද විශේෂ කාර්යයන් තුනක් ලියන්න (ල 03)

iii) A මහසෙන් රජු විසින් ඉදිකරන ලද වැව් දෙකක් ලියන්න (ල. 02)

B ආර්ථික වශයෙන් රට දියුණුවටත් රටවැසියාගේ යහපත සඳහාත් මහසෙන් රජු විසින් කරන ලද කාර්යයන් තුනක් ලියන්න (ල. 03)

For more past papers and exam resources,visit www.pastpaperszone.lk